**ශීර්ෂය 161 - වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

ශීර්ෂය 161 - වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශයේ 2022 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2022 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2023 මැයි 22 දින ප්‍රධාන ගණන්දිමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2023 ජූනි 07 දින ප්‍රධාන ගණන්දිමේ නිලධාරි වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2022 දෙසැම්බර් 31 දිනට වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ**

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරිම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශය විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී.
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.
- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ප්‍රධාන ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

## 1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වේ.

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳ මා විසින් කර තිබුණු පහත සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කර නොතිබුණි.

| ඉකුත් වර්ෂයට අදාළ වාර්තාවේ ඡේද යොමුව | ක්‍රියාත්මක කර නොතිබුණු නිර්දේශය | මෙම වාර්තාවේ ඡේද යොමුව |
|---|---|---|
| 1.6.2.2 | 2021 නොවැම්බර් 26 දිනැති අංක 2021/03 දරන රාජ්‍ය ගිණුම් මාර්ගෝපදේශයේ විධිවිධානවලින් බැහැරව ඒකාබද්ධ ශේෂ පිරික්සුම අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ පුද්ගල පඩිනඩි හා මෙහෙයුම් වියදම් යටතේ දැක්විය යුතු රු.37,074,415ක් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබීම අනුව මුදල් ප්‍රවාහ ප්‍රකාශය තුළ නිවැරදි ආකාරයට මුදල් ප්‍රවාහයන් දැක්විය යුතු බව. | 1.6.1(අ) |

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**1.6.1 ගිණුම්කරණ අඩුපාඩු**

**(අ) පුනරාවර්තන වියදම්**

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| භෞතික වත්කම් පුනරුත්තාපනය සඳහා දරන ලද මෙහෙයුම් වියදම් රු.8,939,169 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ දක්වනු වෙනුවට භෞතික වත්කම් ඉදිකිරීම හෝ මිලදී ගැනීම වශයෙන් ආයෝජන ක්‍රියාකාරකම් යටතේ දක්වා තිබුණි. | 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශය සකස් කිරීමේ දී සංශෝධනය කිරීමට කටයුතු කරන බව. | වියදම් නිවැරදි වර්ගීකරණය යටතේ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ දැක්විය යුතුය. |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 වියදම් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි 50 ප්‍රකාරව වාර්ෂික වියදම් ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණයෙන් හා නිවැරදිව පිළියෙල කළ යුතු වුවද, අමාත්‍යාංශයේ සමාලෝචිත වර්ෂයේ වැය විෂයයන් 25 ක ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 55 ක සිට සියයට 100 ක් දක්වා පරාසයක ඉතිරිවීම් නිරීක්ෂණය විය. | අපේක්ෂිත පරිදි වියදම් ඇති නොවීම. | මුදල් රෙගුලාසිවලට අනුගත වෙමින් වාර්ෂික වියදම් ඇස්තමේන්තු හැකිතාක් දුරට සම්පූර්ණයෙන් හා නිවැරදිව පිළියෙල කළ යුතුය. |

### 2.2 ප්‍රධාන ගණන්දීමේ නිලධාරී විසින් සිදු කළ යුතු සහතිකවීම්

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ප්‍රධාන ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිතාවය පිළිබඳව කලින් කළ සමාලෝචනය සිදු කර ඒ අනුව පද්ධති ඵලදායි ලෙස කර ගෙන යැමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතු බවත්, එම සමාලෝචනයන් ලිඛිතව සිදු කර එහි පිටපතක් විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතුව තිබුණත්, එවැනි සමාලෝචනයන් සිදු කළ බවට ප්‍රකාශ විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. | අමාත්‍යාංශයේ මූල්‍ය පාලනය සඳහා සුදුසු අභ්‍යන්තර පාලන පද්ධතියක් පවතින බව සහ මූල්‍ය පාලනය සඳහා අභ්‍යන්තර පාලන පද්ධතියේ සඵලතාවය අධීක්ෂණය කර එම පද්ධති ඵලදායී ලෙස ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය වෙනස් කිරීම් සිදු කිරීමට වරින් වර සමාලෝචනය කරන බව. | 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වන වගන්තියේ විධිවිධාන පරිදි කටයුතු කළ යුතුය. |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 විදේශ ආධාර ව්‍යාපෘති - පරිසර පද්ධති සංරක්ෂණය හා කළමනාකරණය ව්‍යාපෘතිය (ESCAMP)

| | විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පරිසර පද්ධතිවල කළමනාකරණය වැඩි කිරීම තුළින් එම පරිසර පද්ධති සංරක්ෂණය කර එමඟින් ජනතාවට ප්‍රතිලාභ අත්පත් කර ගැනීම ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණ වුවද, ජීවනෝපායන් වැඩි දියුණු කිරීම හා සුරක්ෂිත කිරීම සඳහා ස්වාභාවික සම්පත් තිරසර ලෙස භාවිතා කිරීම හා අලි මිනිස් සහජීවනය ඇති කිරීම, රක්ෂිත ප්‍රදේශ සංරක්ෂණය හා කළමනාකරණය සහ රක්ෂිත ප්‍රදේශ ආශ්‍රිතව පරිසර හිතකාමී සංචාරක කර්මාන්තය නඟා සිටු වීම යනාදී පරිසර සංරක්ෂණය සඳහා අතිශය වැදගත් වන ව්‍යාපෘති සංරචකයන් සඳහා රු.මිලියන 3,117 ක් වන සියයට 38 තරම් අඩු ප්‍රතිපාදනයක් ද, ආයතන කුසලතාවය හා ආයෝජන ධාරිතාව වැඩිකිරීම සඳහා රු.මිලියන 4,386 ක් හෙවත් සමස්ත ප්‍රතිපාදනයෙන් සියයට 55 ක් ද වෙන් කර තිබුණි. | දීර්ඝ කාලීන පරිසර සංරක්ෂණය සඳහා ආයතන කුසලතාව හා ආයෝජන ධාරිතාව වැඩි කිරීම වැදගත් බැවින් සමස්ථ ප්‍රතිපාදනවලින් සියයට 55 ක් වෙන් කිරීමට කටයුතු කර ඇති අතර පැවති කොවිඩ්19 වසංගත තත්ත්වය හේතුවෙන් හටගත් ගෝලීය හා දේශීය ආර්ථික දුෂ්කරතා හේතුවෙන් ව්‍යාපෘතියේ මූලික අරමුණු ඉටු කර ගැනීමට අවශ්‍ය සංරචකයන්, පුහුණු මධ්‍යස්ථාන, ඒ සඳහා අවශ්‍ය නේවාසිකාගාර හා අනෙකුත් පහසුකම් සැපයීමට වැඩි ප්‍රමුඛතාවක් දැක්වීමට සිදු විය. | ව්‍යාපෘතියේ ප්‍රධාන අරමුණු ඉටු කර ගැනීම කෙරෙහි අවධානය යොමු කර ඊට අනුකූලව ව්‍යාපෘතින් සැලසුම් කර ක්‍රියාත්මක කළ යුතුය. |
| (ආ) | සමාලෝචිත වර්ෂයේදී වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුව හරහා රු.මිලියන 0.72 ක ප්‍රතිපාදන යටතේ ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබූ මොණරාගල දිස්ත්‍රික්කයේ රතුගල ප්‍රදේශයේ පවුල් ඒකක 105 ක ජීවන තත්ත්වය නඟා සිටුවීමේ ක්‍රියාකාරකම් 05 ක් අත්හැර දමා තිබුණු අතර රු.මිලියන 232.93 ක ප්‍රතිපාදන යටතේ නිම කිරීමට සැලසුම් කර තිබූ තවත් කාර්යයන් 09 ක් නිම කිරීමට නොහැකි වී | ආදිවාසී නායකයින්ගේ අකමැත්ත, කලාප අධ්‍යාපන කාර්යාලය මඟින් අදාළ නිර්දේශ ලබා ගැනීමට අපොහොසත් වීම හා සම්බන්ධීකරණ කටයුතු සිදු කිරීමට නොහැකි වීම හේතුවෙන් රතුගල විද්‍යාලය අශ්‍රිතව සැලසුම් කරන ලද වැඩ කටයුතු අතරමග නතර | නියමිත ව්‍යාපෘති කාලය තුළ කාර්යයන් සම්පූර්ණ කර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | තිබුණි. | කිරීමට සිදුව තිබේ. | |
| (ඇ) | උඩවලව ජාතික උද්‍යානය හරහා එක් පවුලක් සඳහා පර්චස් 80 ක බුලත් වගා කිරීමට පහසුකම් සැපයීමේ වැඩසටහන යටතේ රු.මිලියන 0.770 ක් වැය කර පවුල් ඒකක 14 ක් වෙත ලබා දී තිබුණු බුලත් පැළ රෝගයකට ගොදුරු වී අස්වැන්න ලබා ගැනීමට ප්‍රථම විනාශ වී තිබුණි. | දකුණු පළාතේ බුලත් පැල රෝගයකට ගොදුරුවීම නිසා තවාන්කරුවන්ගෙන් සහනදායී මිලකට නැවත බුලත් පැල ලබා දීමට වනජීවී සංරක්ෂණ දෙපාර්මේන්තුව කටයුතු කර ඇත. | ගුණාත්මක බවින් වැඩි නිෂ්පාදන මිලදී ගැනීමටත්, පසු විපරම් කටයුතු සිදු කිරීමටත් කටයුතු කළ යුතුය. |
| (ඈ) | සමාලෝචිත වර්ෂයේදී වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව විසින් සංරචක 3(a) රක්ෂිත ප්‍රදේශ සංරක්ෂණය හා කළමනාකරණය යටතේ රු.මිලියන 61.5 ක ප්‍රතිපාදන මඟින් නිම කිරීමට සැලසුම් කර තිබූ ක්‍රියාකාරකම් 07 ක භෞතික ප්‍රගතිය සියයට 32 ත් සියයට 65 ත් අතර ද, සංරචක 3(b) රක්ෂිත ප්‍රදේශ ආශ්‍රිතව පරිසර හිතකාමී සංචාරක කර්මාන්ත නගා සිටුවීම යටතේ රු.මිලියන 10 ක ප්‍රතිපාදනයෙන් ඉදි කිරීමේ කාර්යයන් 02 ක භෞතික ප්‍රගතිය සියයට 40 ක් ද විය. | පැවති ඉන්ධන අර්බුදය හා ගොඩනැගිලි ද්‍රව්‍ය මිල ඉහළයාම නිසා සිංහරාජ හා නකල්ස් ඉදිකිරීම් අඩපන වුව ද, ව්‍යාපෘති කළමනාකරණ ඒකකය මඟින් ව්‍යාපෘති කාලය තුළ ඒවා අවසන් කිරීමට පියවර ගෙන ඇත. | නියමිත ව්‍යාපෘති කාලය තුළ කාර්යයන් සම්පූර්ණ කරගත යුතුය. |
| (ඉ) | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ හා වන සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ ආයතනික ධාරිතාවය සංවර්ධනය කිරීම සඳහා ව්‍යාපෘති කළමනාකරණ ඒකකය විසින් ක්‍රියාත්මක කරනු ලබන මූලික ඇස්තමේන්තුව රු. මිලියන 1,913 ක් වූ ව්‍යාපෘති 06 ක, කොන්ත්‍රාත් අත්හිටුවා නැවත රු.මිලියන 1,738 කට නව ව්‍යාපෘති වශයෙන් 2023 මැයි 31 දින අවසන් කිරීමට පවරා තිබුණි. ඒ අනුව එම ව්‍යාපෘති සඳහා මූලික ඇස්තමේන්තුව ඉක්මවා අධික පිරිවැයක් වැයවන බවට නිරීක්ෂණය විය. | රට තුළ පැවති ආර්ථික අවපාතය හේතුවෙන් ඉදිකිරීම් ද්‍රව්‍ය හිඟවීම හා මිල ඉහළ යාම නිසා පෙර ගිවිසගත් ලෙස කොන්ත්‍රාත් නිම කිරීමට කොන්ත්‍රාත්කරුවන් අපොහොසත් වීමෙන් ඔවුන් ව්‍යාපෘතිවලින් ඉවත් වීමට කටයුතු කරන ලදී. අමාත්‍යාංශයේ මග පෙන්වීම් අනුව පවතින වෙළඳපොළ මිලගණන් අනුව නව කොන්ත්‍රාත්කරුවන් | නියමිත ව්‍යාපෘති කාලය තුළ කාර්යයන් සම්පූර්ණ කර ගත යුතුය. |

| | | | |
|---|---|---|---|
| | | සමඟ ගිවිසුම්ගත වී එම ව්‍යාපෘති සම්පූර්ණ කිරීමට ව්‍යාපෘති කළමනාකරණ ඒකකයට සිදුවිය. | |
| (ඊ) | වනජීවී සංරක්ෂණ දෙපාර්තමේන්තුවේ නිලධාරින් 30 දෙනෙකු සඳහා කොළඹ විශ්ව විද්‍යාලය මඟින් පවත්වන ලද ශ්‍රී ලංකා යෝග්‍යතා මාර්ගෝපදේශ (SLQF) 3 වන ස්ථරයට අයත් වනජීවී කළමනාකරණය පිළිබඳ ඩිප්ලෝමා පාඨමාලාවේ 2017/2018 කණ්ඩායම සඳහා අයකළ පාඨමාලා ගාස්තුව රු.3,300,000 ක් වුවද, 2019/2020 කණ්ඩායම සඳහා ඊට වඩා රු.11,700,000 ක් වැඩියෙන් රු.15,000,000 ක ගාස්තුවක් අයකර තිබුණු අතර මෙම පාඨමාලාව සඳහා වැයකළ මුළු මුදල රු.38,819,579 ක් වීමෙන් එක් නිලධාරියෙකු වෙනුවෙන් වැයකළ මුදල රු.1,293,333ක් වී තිබුණි. එම විශ්ව විද්‍යාලය මඟින් පවත්වන ලද SLQF 8 වන ස්ථරයේ පශ්චාත් උපාධි ඩිප්ලෝමා පාඨමාලාවේ එක් සිසුවෙකුගේ ගාස්තුව රු.250,000 ක් වීමත්, කොළඹ විශ්ව විද්‍යාලය තෝරාගැනීමේදී ලෝක බැංකුවේ මෙහෙයුම් මාර්ගෝපදේශ අනුගමනය කර නොතිබීමත්, විශ්ව විද්‍යාලයට ගෙවූ රු.21,590,108කට අදාළ ඉන්වොයිසිවල මුල් පිටපත් හා රු.12,785,500 ක අත්තිකාරම් පියවීමට අදාළ වවුචර්වල මුල් පිටපත් විගණනයට ඉදිරිපත් කර නොතිබීමත් යනාදී කරුණු අනුව ද මෙය අරපිරිමැසුම්දායි ගනුදෙනුවක් බවට නිරීක්ෂණය කළ නොහැකි විය. | සැලසුම් කළ පරිදි ගිරිතලේ පිහිටි වනජීවී පර්යේෂණ හා පුහුණු කේන්ද්‍රයේ පාඨමාලාව පැවැත්වීමට නොහැකි වීම නිසා අනපේක්ෂිත වියදම් දැරීමට සිදුවීමත්, ක්ෂේත්‍ර නිලධාරීන්ගේ හැකියා වර්ධනය සඳහා අධ්‍යයනයන් රාශියක් ශ්‍රී ලංකාව පුරා පිහිටි රක්ෂිත ප්‍රදේශ ආශ්‍රිත ව සිදු කළ යුතුව තිබීමත් හේතුවෙන් මෙම පාඨමාලාව සඳහා වැඩි පිරිවැයක් දැරීමට සිදු විය. | නියමිත මාර්ගෝපදේශයන් අනුගමනය කළ යුතු අතර වියදම් අවම වන අයුරින් කටයුතු සැලසුම් කළ යුතුය. |

## 3.2 ප්‍රසම්පාදනයන්

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2016 ජුනි 01 දින සිට මහල් හයකින් යුතු සිනෝ ලංකා ගොඩනැගිල්ලේ මහල් 04 ක වර්ග අඩි 22,522 ක වපසරියක වනජීවී හා වන සම්පත් සංරක්ෂණ අමාත්‍යාංශය පවත්වාගෙන යනු ලබන අතර 2021 මැයි මස 31 දින ගිවිසුම්ගත කාලය අවසන් වීම නිසා 2021 ජූනි මස 01 දින සිට 2023 මැයි 31 දින දක්වා වසර 02 ක කාලයක් සඳහා කැඳවූ මිල ගණන් අනුව ඒ ආසන්නයේ පිහිටි ගොඩනැගිල්ලකින් ලැබී තිබුණු රු.121,618,800 ක මිල ගණන් නොසලකා ඊට වඩා රු.18,561,425ක් වැඩියෙන් රු.140,180,225 කට කැබිනට් මණ්ඩල අනුමැතිය යටතේ නැවත වරක් මෙම ගොඩනැහිල්ලම කුලියට ගෙන තිබුණි. තවද, මෙම ගොඩනැගිල්ල සඳහා රජයේ මාසික තක්සේරුව රු.8,100,000 ක් වුවද, ඊට වඩා රු. 4,383,593 ක් වැඩියෙන් රු.12,483,593 ක මාසික කුලියක් මෙම ගොඩනැගිල්ලට ගෙවා තිබුණු අතර අමාත්‍යාංශය පවත්වාගෙන යාම සඳහා රජයේ ගොඩනැගිල්ලකින් ඉඩකඩ පහසුකම් වෙන්කර ගැනීමට ප්‍රමාණවත් ආකාරයට කටයුතු කර ඇති බවට ද නිරීක්ෂණය නොවීය. | මේ අමාත්‍යාංශය සඳහා මේ වන විට ඉදිවෙමින් පවතින සෙත්සිරිපාය අදියර 111 ගොඩනැගිල්ලේ ඉඩකඩ ලැබෙන තෙක් මෙම අමාත්‍යාංශය පවත්වා ගෙන යනු ලබන රාජගිරිය, සිනෝ ලංකා ගොඩනැගිල්ල තුළ, 2021.06.01 දින සිට වසර දෙකක් සඳහා ඉදිරියටත් පවත්වා ගෙන යාහැකි බවට යෝජනා කර ඇත්තේ මුදල් අමාත්‍යාංශය විසින් බැවින් මෙම අමාත්‍යාංශය විසින් ඒ සඳහා එකඟතාව පල කර ඇත. | වියදම් අවම වන ආකාරයට කටයුතු සැලසුම් කළ යුතුය. |

## 4. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2022 දෙසැම්බර් 31 දිනට අමාත්‍යාංශයේ අනුමත සේවක සංඛ්‍යාව 148 ක් වුවද, තථ්‍ය සේවක සංඛ්‍යාව 110 ක් විය. ඒ අතර ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 16 ක් ඇතුළුව තනතුරු 38 ක් පුරප්පාඩු වී පැවතුණි. | පුරප්පාඩු පිරවීමට කටයුතු කරමින් පවතී. | පුරප්පාඩු පිරවීමට හෝ පවතින සේවක සංඛ්‍යාව මත කටයුතු පවත්වාගෙන යා හැකි ලෙස කාර්යය මණ්ඩලය සංශෝධනය කිරීමට කටයුතු කළ යුතුය. |